# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ **2005** ජූනි මස **13** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ජූනි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
**II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. **23**.**00** යි. තැපැල් ගාස්තුව **:** රු. **10**.**00** යි.

# 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2005 ජුනි මස 13 වන දින]

එල්. ඩී.— ඕ. 3/2005.

**2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි විපතින් හානියට පත් තැනැත්තන් සහ දේපළ සම්බන්ධයෙන් විශේෂ නෛතික විධිවිධාන සැදීමට හැකිවීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ තැනැත්තන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත සහ දේපළවලට ඉමහත් අලාභ සිදු කරමින් 2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් හානියට පත් තැනැත්තන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් පිළිබඳව සහතික වීම සහ එවැනි ආරක්ෂාවක් ලබාදීම රජයේ ජාතික ප්‍රතිපත්තිය වන හෙයින් ද : පූර්විකාව.

සුනාමි විපතින් හානියට පත් තැනැත්තන්ට දැනට බලපවත්නා නීති යටතේ සලකනු ලබන ඇතැම් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහ ඇතැම් ප්‍රතිලාභ භුක්ති විඳීමට නොහැකි වී ඇති හෙයින් සහ දැනට බලපවත්නා නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් ඇතැම් අවහිරතාවන්ට සහ අවාසි සහගත තත්ත්වයන්ට මුහුණ දී ඇති හෙයින් ද :

සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රමාණවත් දෙමාපිය රැකවරණයක් නොලැබෙන ළමයින් සහ යෞවනයන් විශාල පිරිසක් සිටින බැවින් සහ ඔවුන්ට විකල්ප රැකවරණ සහ ආරක්ෂාව ලබාදීමට වගබලා ගැනීම අවශ්‍ය වන හෙයින් ද :

සුනාමි විපතින් හානියට පත් තැනැත්තන්ට දැනට බලපවත්නා නෛතික අවහිරතාවලින් සහ දැනට පවත්නා නෛතික අවහිරතා ජයගැනීමට හැකිවනු පිණිස සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ රැකගැනීම සහතිකවීම පිණිස ද විශේෂ නෛතික විධිවිධාන සැදීමේ කඩිනම් අවශ්‍යතාවයක් දැනට ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2–P L. 000227 – 4,500 (2005/04)

## I වන කොටස

## මරණ සහතික නිකුත් කිරීම

2004 දෙසැම්බර් මස 26 වන දින වන විට ඇතැම් ප්‍රදේශවල පදිංචිව සිටි තැනැත්තන් අතුරුදහන් වී ඇති අවස්ථාවල දී.

**2**. සාක්ෂි ආඥාපනතේ 108 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2004 දෙසැම්බර් මස 26 වන දින වන විට මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ප්‍රදේශයක පදිංචිව සිටි යම් තැනැත්තකු හෝ එම දිනයේ දී එම ප්‍රදේශයේ සිටි බවට හෝ එම ප්‍රදේශය හරහා ගමන් කරමින් සිටි බවට දැනගැනීමට ලැබී ඇති යම් තැනැත්තකු, එම තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහු පිළිබඳව සාමාන්‍යයෙන් දැනගැනීමට ලැබෙන තැනැත්තන්ට එදින සිට මාස හයක් තුළ ඔහු සොයා ගැනීමට නොහැකිව සිටින අවස්ථාවක සහ ඔහු පිළිබඳව දැන ගැනීමට නොහැකිව සිටින අවස්ථාවක සහ ඔහුගේ අතුරුදහන්වීම, සුනාමි විපත නිසා සිදු වූ බවට සැලකිය හැකි අවස්ථාවක, ඔහු ජීවත්ව සිටින බවට ඔප්පු කිරීමේ භාරය එය සහතික කරන තැනැත්තා මත පැවරේ.

2 වන වගන්තියේ සඳහන් තැනැත්තන් සම්බන්ධයෙන් මරණ සහතික ලබාගැනීමේ කාර්ය පටිපාටිය.

**3**. (1) 2 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා එම තැනැත්තාගේ ළඟම ඥාතියා විසින් හෝ එවැනි ළඟම ඥාතියකු ජීවත්ව නොසිටින අවස්ථාවක, එම තැනැත්තා පිළිබඳව දන්නා වෙනත් යම් තැනැත්තකු විසින්, මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඉල්ලුම් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් 2004 දෙසැම්බර් මස 26 වන දින සිට මාස හයක් ඉකුත්වීමෙන් පසුව කවර හෝ අවස්ථාවක දී මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුකූලව කළ යුතු අතර, එම ඉල්ලීම එසේ අතුරුදහන්ව සිටින තැනැත්තා පදිංචිව සිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ග්‍රාම නිලධාරි වෙත එවැනි ඉල්ලීමක් ලැබුණු වහාම ඔහු විසින් තම කාර්යාලයේ දැන්වීමක් ප්‍රදර්ශනය කරමින්, ඉල්ලා ඇති මරණ සහතිකය නිකුත් කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා එම දැන්වීමේ දින සිට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දැනුම් දිය යුතු ය. විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව අවසන් වීමේ දී සහ ඔහු විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් සහ එම ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර පොලිස් ස්ථානාධිපතිවරයාගේ වාර්තාව ලබාගැනීමෙන් පසු, ඔහු විසින් එම ඉල්ලීම සහතික කර, එහි සඳහන් සිද්ධිමය කරුණුවල නිරවද්‍යතාව පිළිබඳ සිය වාර්තාව ද සමග එය තම ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එවැනි සෑම ඉල්ලීමක්ම පිටසන් කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඒවා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව යථා පරිදි සත්‍යායනය කරන ලද සහ පිටසන් කරන ලද ඉල්ලීමක් ලැබීමේ දී (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයකු විසින් එම ඉදිරිපත් කරන ලද ලේඛන සම්බන්ධයෙන් සෑහීමට පත් වීමෙන් පසු, ඔහු විසින් පවත්වාගෙන යනු ලබන මරණ පිළිබඳ නාම ලේඛනයේ එම ඉල්ලීමේ සඳහන් තොරතුරු ලියාපදිංචි කරන ලෙස සහ එම තැනැත්තා සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කරන ලෙස අදාළ රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියමයක් කළ යුතු අතර, එම අදාළ රෙජිස්ට්‍රාර්වරයා විසින් වහාම එම තොරතුරු එම නාම ලේඛනයේ සටහන් කොට, එම නාම ලේඛනයේ උචිත ස්ථානයෙහි අත්සන් තැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද නියමය අදාළ ලියාපදිංචි කිරීමේ සටහනේ දෙවන පිටපතට අමුණනු ලැබිය යුතු අතර, එම දෙවන පිටපත සහ නියමය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ භාරයේ තැබීම පිණිස ඔහුගේ කාර්යාලය වෙත යැවීම සඳහා, රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

3 වන වගන්තිය යටතේ මරණ සහතිකයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු ජීවත්ව සිටින බවට තොරතුරු ලැබෙන අවස්ථාවක දී.

4. (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව යම් මරණයක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, සහ ඉන්පසු කවර හෝ අවස්ථාවක දී මරණය ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා ජීවත්ව සිටින බවට යම් තැනැත්තකුට දැනගැනීමට ලැබෙන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් වහාම එම තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාලවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) එවැනි තොරතුරක් ලැබුණු විට රෙජිස්ට්‍රාර්ජනරාල්වරයා විසින් එම තොරතුර අදාළ පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු අතර, එම තොරතුරු තමා වෙත ලැබුණු දින සිට සති හතරක් ඇතුළත ඔහු විසින් එම තොරතුරේ සත්‍යතාව පිළිබඳ විමර්ශනය කර, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වාර්තාවක් ලැබුණු පසු සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු මරණය ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා ජීවත්ව සිටින බවට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් වාර්තාව නිවැරදි කිරීම සඳහා අවස්ථානුගත කරුණුවලට උචිත පරිදි (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය යටතේ යම් ක්‍රියාවක් කිරීම හෝ නියමයක් කිරීම හෝ විධානයක් දීම කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන යම් පරීක්ෂණයක් එය ආරම්භ කර එක් මාසයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු අතර, එම පරීක්ෂණයේ කාර්ය සඳහා, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට අදාළව ඔහු විසින් එම පනත යටතේ ක්‍රියාත්මක කළ හැකි සියලු බලතල, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

වැරදි.

**5**. (අ) 3 වන වගන්තිය යටතේ තමා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන ;

(ආ) 3 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව මරණය ලියාපදිංචි කරනු ලැබ ඇති යම් තැනැත්තකු ජීවත්ව සිටින බවට දැන ගැනීමට ලැබී, එම තොරතුර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම පැහැර හරින ; හෝ

(ඇ) (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද මරණ සහතිකයක නම සඳහන් තැනැත්තකු ජීවත්ව සිටින බව දැන දැනම හෝ එසේ ජීවත්ව සිටින බවට විශ්වාස කිරීමට හේතු ඇතිව, එම සහතිකය වංක ලෙස හෝ වංචනික ලෙස ප්‍රයෝජනයට ගන්නා,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයකට පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**6**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ මේ කොටසෙහි –

"අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" "අදාළ රෙජිස්ට්‍රාර්වරයා" සහ "දිස්ත්‍රික්" යන යෙදුම්වලට (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ ඒවාට ලබා දී ඇති අර්ථයම ඇත්තේ ය;

"දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද උප්පැන්න සහ මරණ පිළිබඳ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ ; සහ

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන් (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වන අතර, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු ද ඊට ඇතුළත් වේ.

## II වන කොටස

### ළමයින් සහ යෞවනයන්ගේ භාරකාරත්වය

පනතේ විධිවිධාන අදාළ කර ගැනීම.

7. 2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් –

(අ) දෙමාපියන් අහිමි වූ සෑම ළමයකුටම සහ යෞවනයකුටම ;

(ආ) දෙමාපිය දෙදෙනාගෙන් එක්කෙනකු අහිමි වූ සහ ජීවත්ව සිටින මවට හෝ පියාට රැකබලා ගැනීමට හැකියාවක් නොමැති සෑම ළමයකුටම ; සහ

(ඇ) දෙමාපිය දෙදෙනාගෙන් එක්කෙනකු අහිමි වූ සහ රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය එහෙත් ඒ රැකවරණය සහ ආරක්ෂාව සැපයීමට ජීවත්ව සිටින මව හෝ පියාට හැකියාවක් නොමැති සෑම යෞවනයකුටම,

මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ වන්නේ ය.

අධිකාරිය විසින් රෙජිස්ටරයක් පවත්වාගෙන යායුතු බව.

8. (1) 11 වන වගන්තිය යටතේ, අනාථයකු බවට පත් වූ සෑම ළමයකුටම සහ මේ පනතේ කැපකරු මාපිය රැකවරණය යටතේ තැබීමට මනාප සෑම ළමයකු සහ යෞවනයකුටම අදාළ තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක පනත යටතේ පිහිටුවන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයේ නිවැරදි තොරතුරු අන්තර්ගතව තිබෙන බවට සහතික වීමේ කාර්ය සඳහා, එම රෙජිස්ටරයේ තොරතුරු වාර්තාගත කර ඇති ළමයින් සහ යෞවනයන් පිළිබඳව අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් පරීක්ෂණයක් පැවැත්වීම අධිකාරිය විසින් කරනු ලැබිය යුතු ය.

වර්තමාන භාරකරු ලෙස ලියාපදිංචි වීම.

**9**. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ දී මේ පනතේ 7 වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් ළමයකුගේ භාරකාරත්වය ඇති සෑම තැනැත්තකුම, එම තැනැත්තා –

(අ) ළමයාගේ දෙමාපියන් වන්නේ නම් මිස ; හෝ

(ආ) 2004 දෙසැම්බර් මස 26 වන දිනට පසු යම් නීතියක් යටතේ ළමයාගේ භාරකාරත්වය ප්‍රදානය කරනු ලැබ ඇත්නම් මිස, හෝ ළමයාගේ රැකවරණය භාර දී ඇත්නම් මිස,

එම තැනැත්තා විසින් වහාම සහ කවර ආකාරයෙන් හෝ මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දින සිට එක් මාසයක් ඇතුළත, එම ළමයාගේ වර්තමාන භාරකරු ලෙස ලියාපදිංචි වීමේ කාර්ය සඳහා, මේ පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් ආකෘතිය අනුව ඉල්ලීමක් (මෙහි මින්මතු "කොමසාරිස්වරයා" ලෙස හඳුන්වනු ලබන) පරිවාස හා ළමා ආරක්ෂක සේවා කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලීමක් භාර ගෙන, එය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමේ බලය, අවශ්‍ය අවස්ථාවන්හි දී කොමසාරිස්වරයා විසින් ළමයා දැනට පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත සාධාරණ හේතුවක් නොමැතිව, ලියාපදිංචිවීම පැහැර හරින, (1) වන උපවගන්තියේ සඳහන් ළමයකුගේ භාරය ඇති සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී අවුරුදු දෙකකට නොඅඩු කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට වූ බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියම කර ඇති පරිදි ලියාපදිංචි වීම පැහැර හරින තැනැත්තකුගේ භාරයේ සිටින ළමයකු, එම ළමයාගේ උපරිම සුභසිද්ධිය උදෙසා මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන ආඥාවක් මත එම ළමයා කොමසාරිස්වරයා විසින් වහාම එම තැනැත්තාගේ භාරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලුම වර්තමාන භාරකරුවන්ට අදාළව ලබාගත හැකි සියලු තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යා යුතු අතර තොරතුරුවල පිටපතක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන සුනාමි විපතින් හානියට පත් ළමයින්ට රැකවරණය ලබාදෙන සෑම ආයතනයක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

වර්තමාන භාරකරුගේ කාර්යභාරය.

**10**. (1) සෑම වර්තමාන භාරකරුවකු යම් ළමයකුගේ වර්තමාන භාරකරුවකු ලෙස සිටින තාක් කල්, ඔහු හෝ ඇයගේ රැකවරණයේ සිටින ළමයාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් ඇතුළු සියලුම රැකවරණ සහ ආරක්ෂාව ලබාදීම ඔහු හෝ ඇයගේ කාර්ය විය යුතු ය.

(2) වර්තමාන භාරකරුවකු වශයෙන් සිටින යම් පුද්ගලයකුගේ රැකවරණයේ සිටින ළමයකු හට කැපකරු මාපියකු වීමට එම පුද්ගලයා කැමති වන්නේ නම්, ඒ කාර්යය සඳහා මේ පනතේ 13 වන වගන්තිය යටතේ ඉල්ලීමක්, එම පුද්ගලයා ළමයාගේ වර්තමාන භාරකරු ලෙස ලියාපදිංචි වී මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

කැපකරු මාපිය රැකවරණයට මනාප බව අධිකාරියට දැනුම් දීම.

**11**. (1) 7 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ළමයකු කැපකරු මාපිය රැකවරණය යටතේ තැබීමට මනාප, එම ළමයාගේ මාපියකු විසින් මෙම පනත ක්‍රියාත්මක වී මාස හයක් ඇතුළත ඒ පිළිබඳව අධිකාරියට දැනුම් දීම ඔහුගේ හෝ ඇයගේ කාර්යය විය යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණය යටතට පත්වීමට මනාප වන්නා වූ 7 වන වගන්තියේ (අ) හෝ (ඇ) ඡේදයේ සඳහන් යෞවනයකු විසින් මෙම පනත ක්‍රියාත්මක වී මාස හයක් ඇතුළත, ඒ පිළිබඳව අධිකාරියට දැනුම් දිය හැකි ය.

අධිකාරිය භාරකරු විය යුතු බව.

**12**. (1) මාපියන් විසින් කැපකරු මාපිය රැකවරණ යටතේ තැබූ සෑම ළමයකුම සහ අනාථ දරුවකු බවට පත්ව ඇති සෑම ළමයකුම, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී යම් තැනැත්තකුගේ භාරකාරත්වය යටතේ එම ළමයා සිටිය ද, නැතහොත් එසේ නොසිටිය ද අධිකරණයේ පරම භාරකාරත්වයට යටත්ව, අධිකාරිය එවැනි සෑම ළමයකුගේ ම භාරකරු වන්නේ ය.

(2) කවර හෝ හේතුවක් නිසා කැපකරු මාපිය රැකවරණය යටතේ නොසිටින සෑම ළමයකුටම හෝ කැපකරු මාපිය රැකවරණය ලැබීම නැවතී ඇති සෑම ළමයකුටම, අධ්‍යාපනය ලබාදීම ඇතුළු ප්‍රමාණවත් රැකවරණය, භාරකාරත්වය සහ ආරක්ෂාව සලසන බවට ද, එම ළමයාට විඳීමට සිදු වූ චිත්ත කම්පනය සැලකිල්ලට ගෙන ඔහුට අවශ්‍ය වන යම් විශේෂ රැකවරණයක් ලබාදෙන බවට ද සහතික වීම, අධිකාරියේ කාර්යය විය යුතු අතර, එම ළමයාට සුදුසු කැපකරු මාපියකු සොයා දීමට අධිකාරිය සෑම උත්සාහයක්ම දැරිය යුතු ය.

කැපකරු මාපියකු වීම සඳහා ඉල්ලීම.

**13**. (1) මේ පනතේ 7 වන වගන්තියේ සඳහන් ළමයකුගේ හෝ යෞවනයකුගේ කැපකරු මාපියකු වීමට කැමති වන්නා වූ ද, ඒ ළමයාගේ වර්තමාන භාරකරු වශයෙන් සිටින පුද්ගලයා ඇතුළුව යම් තැනැත්තකු විසින්, එම තැනැත්තා පදිංචි අධිකරණ බල ප්‍රදේශයේ පිහිටි මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කැපකරු මාපිය රැකවරණ නියෝගයක් නිකුත් කිරීම සඳහා, මේ පනතේ හතරවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ආකාරයට, ඉල්ලීමක් කළ යුතු ය. පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් තොරතුරු සමග ඉල්ලීමේ පිටපතක්, අධිකාරිය වෙත යැවිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණය විසින්, මේ පනතේ 15 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ නිර්දේශය ලැබෙන තෙක්, (1) වන උපවගන්තිය යටතේ ලැබුණ කිසිම ඉල්ලීමක් මත නියෝගයක් නොකළ යුතු ය.

අධිකාරිය විසින් ඉල්ලීම කැපකරු මාපිය රැකවරණ අගැයීම් මණ්ඩලය වෙත යොමු කිරීම.

14. (1) 13 වන වගන්තිය යටතේ ඉල්ලීමක පිටපතක් ලැබීමේ දී, ඉල්ලුම්කරුට කැපකරු මාපියකු වීමට ඇති යෝග්‍යතාව අගැයීමේ කාර්යය සඳහා, කැපකරු මාපිය නියෝගයක් සඳහා එම ඉල්ලීම ඉදිරිපත් කළ තැනැත්තා පදිංචි පළාතේ (මෙම පනතේ “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) කැපකරු මාපිය රැකවරණ මණ්ඩලය වෙත, එම ඉල්ලීම, අධිකාරියේ සභාපතිවරයා විසින් යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අධිකාරියේ සභාපතිවරයා, හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු ;

(ආ) ශ්‍රී ලංකා ළමා රෝග වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන තැනැත්තකු ;

(ඇ) අදාළ පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු;

(ඈ) අධිකාරිය විසින් නම් කරනු ලබන මනෝ විද්‍යාඥයකු ;

(ඉ) අධිකාරිය විසින් නම් කරනු ලබන මනෝ වෛද්‍යවරයෙක් ;

(ඊ) අදාළ පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු ; සහ

(උ) අදාළ පළාතේ, පළාත්බද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු.

(3) මේ පනතේ මේ කොටස යටතේ මණ්ඩලය වෙත පවරනු ලබන කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වනතාක් කල් මණ්ඩලය කටයුතු කළ යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් විසින් එම සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස තෝරා පත්කරගත යුතු අතර, එම සාමාජිකයන් විසින් මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද තීරණය කරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනකු විය යුතු ය.

(5) කැපකරු මාපියකු වීමට යම් ඉල්ලුම්කරුවකුට ඇති යෝග්‍යතාව අගැයීමේ දී ප්‍රධානතම වශයෙන් සැලකිල්ල දැක්විය යුත්තේ ළමයාගේ උපරිම සුභ සිද්ධිය වන අතර, එම කාර්යය සඳහා මණ්ඩලය විසින් මේ පනතේ හයවන උපලේඛනයේ සඳහන් මාර්ගෝපදේශයන් යොදා ගත යුතු ය. මණ්ඩලය විසින් මේ පනතේ හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් තනතුරක් දරන තැනැත්තකුගෙන් පරිසර අධ්‍යයන වාර්තාවක් ලබාගත යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා "පරිසර අධ්‍යයන වාර්තාවක්" යන්නෙන් ඉල්ලුම්කරුවන්ගේ මානසික ස්වස්ථය, ඔවුන්ගේ සාමාජීය, ආගමික සහ ආර්ථීක පසුබිම පිළිබඳව සහ කැපකරු මව්පියකුවීම සඳහා ඔවුන්ගේ යෝග්‍යතාව පිළිබඳ වාර්තාවක් අදහස් වේ.

මණ්ඩලය විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව.

**15**. (1) අධිකාරියේ ඉල්ලීමක් ලැබී සති දෙකක් ඇතුළත මණ්ඩලය විසින්, එම ඉල්ලීම අගැයීමෙන් පසු තම නිර්දේශය අධිකාරියේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධිකාරියේ සභාපතිවරයා විසින් එම නිර්දේශය මේ පනතේ 13 වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි ළමයාට හෝ යෞවනයාට ආදාළව ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලුම්කරුගේ වාසියට කැපකරු මාපිය රැකවරණ ආඥාවක් කරනු ලැබුවහොත්, සමීක්ෂණ නිලධරයකු වශයෙන් මේ පනතේ 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍ය ඉටු කිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තා අධිකාරිය විසින් ධුරයෙන් සහ නමින් හැඳින්වීම, (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් නිර්දේශ ඉදිරිපත් කරන විට දී කළ යුතු ය. අධිකාරිය විසින් සමීක්ෂණ නිලධරයා වශයෙන් තෝරාගනු ලබන තැනැත්තා මේ පනතේ හත්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ධුර දරන තැනැත්තන් අතුරින් තෝරා ගනු ලැබිය යුතු ය.

කැපකරු මාපිය රැකවරණ ආඥාව.

**16**. (1) අධිකාරියේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ නිර්දේශ ලැබීමෙන් පසු සහ කැපකරු මාපියකු වීමට ඉල්ලුම්කරුගේ යෝග්‍යතාව පිළිබඳව මණ්ඩලය නිර්දේශ කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ළමයා වයස අවුරුදු දහයට වැඩි නම්, එම ළමයාගේ නැතහොත් යෞවනයාගේ කැමැත්ත ඇතිව, මහෙස්ත්‍රාත්

අධිකරණය විසින්, ඉල්ලීමේ කැපකරු මාපියකු හෝ මාපියන් වශයෙන් නම් කරනු ලැබ ඇති තැනැත්තා හෝ තැනැත්තන්, පත්කරමින් කැපකරු මාපිය රැකරවරණ ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය. නිකුත් කරනු ලබන කැපකරු මාපිය රැකවරණ ආඥාව මේ පනතේ අටවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු අතර එය එම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණ ආඥාව නිකුත් කිරීමේ දී 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් හඳුන්වා ඇති තැනැත්තා අධිකරණය විසින් සමීක්ෂණ නිලධරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු අතර, කැපකරු මාපිය රැකවරණ ආඥාව නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා හෝ යෞවනයා සම්බන්ධයෙන් මේ පනතේ 18 වන වගන්තියේ සඳහන් කර්තව්‍ය එම සමීක්ෂණ නිලධරයා විසින් ඉටුකළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද කැපකරු මාපිය රැකවරණ ආඥාවක්,–

(අ) ළමයකු සම්බන්ධයෙන් වන විට, එක් අවුරුද්දක කාලයක් ගතවීමට පෙර එම ළමයා වයස අවුරුදු දහඅටට එළඹුන ද, නිකුත් කිරීමේ දින සිට එක් අවුරුදු කාලයක් සඳහා එම ආඥාව වලංගුව පැවතිය යුතු ය ; හෝ

(ආ) යෞවනයකු සම්බන්ධයෙන් වන විට, එම ආඥාව එම යෞවනයා වයස අවුරුදු විසි එකට එළඹෙන තුරු හෝ එම කැපකරු මාපිය රැකවරණ ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් වයසක් එළඹෙන තුරු, වලංගුව පැවතිය යුතු ය.

(4) ළමයකු සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන කැපකරු මාපිය රැකවරණ ආඥාවක් එක් අවුරුදු කාලසීමාවක් ඉකුත්වීමට පෙර තත් කාර්ය සඳහා ආඥාව කරන ලද මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, 20 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ළමයා වයස අවුරුදු විසිඑකට එළඹෙන තුරු, එක් වරකට එක් වර්ෂය බැගින් තවදුරටත් වූ කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කැපකරු මාපිය රැකවරණ ආඥාවක් නිකුත් කිරීම නොතකා ළමයා වයස අවුරුදු දහඅටට එළඹෙන තුරු අධිකාරිය කැපකරු ළමයකුගේ භාරකරු වශයෙන් දිගටම කටයුතු කළ යුතු ය.

**17**. යම් කැපකරු මාපියකු ළමයකුගේ හෝ යෞවනයකුගේ ස්වභාවික මාපියකු ලෙස සලකා, එම ළමයාට හෝ යෞවනයාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් සැලසීම සහ එම ළමයාට හෝ යෞවනයාට සිදු වූ බලවත් චිත්ත කම්පනය සැලකිල්ලට ගෙන ඔහුට අවශ්‍ය විය හැකි යම් විශේෂ රැකවරණයක් ලබාදීම ඇතුළුව එම ළමයාට හෝ යෞවනයාට රැකවරණය සහ ආරක්ෂාව ලබා දීම ද, සියලු පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ වෙනත් සියලු වගකීම් ඉටු කිරීම ද, සෑම කැපකරු මාපියකුගේම කාර්ය භාරය විය යුතු ය.

කැපකරු මාපියකුගේ කාර්ය භාරය.

**18**. (1) මේ පනතේ 16 වන වගන්තිය යටතේ කැපකරු මාපිය රැකවරණ ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක කැපකරු මාපියන් වෙත පනවනු ලැබ ඇති කාර්ය සහ වගකීම ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව සමීක්ෂණය කිරීම, සහ මේ පනතේ නවවන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව සෑම මාස තුනකට වරක්ම අධිකාරිය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම, එම වගන්තියෙහි (2) වන උපවගන්තිය යටතේ සමීක්ෂණ නිලධරයා ලෙස පත් කරනු ලැබූ තැනැත්තාගේ කාර්ය වන්නේ ය.

කැපකරු මාපිය රැකවරණ ආඥාවක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ළමයකු හෝ යෞවනයකු සම්බන්ධයෙන් ද, එම ළමයා හෝ යෞවනයා සම්බන්ධයෙන් සමීක්ෂණ නිලධරයකුට ඇති කාර්යභාරය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත එවන ලද වාර්තාවේ පිටපත මණ්ඩලය විසින් අගැයීම සහ සලකා බැලීම සඳහා අධිකාරියේ සභාපතිවරයා විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, වාර්තාව අගැයීම පිළිබඳ මණ්ඩලයේ මත ප්‍රකාශය, එම වාර්තාව ලැබී සතියක් ඇතුළත මණ්ඩලය විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

**19**. (1) 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තම කාර්ය ඉටුකිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි ළමයා හෝ යෞවනයා තත් කාලයේ පදිංචිව සිටින පරිශ්‍රයකට කවර හෝ අවස්ථාවක දී ඇතුළු වී එය පරීක්ෂා කිරීමට සහ සමීක්ෂණ නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන්ගෙන් ප්‍රශ්න කිරීමට, එම නිලධරයාට බලය ඇත්තේ ය.

යම් පරිශ්‍ර ආදියට ඇතුළු වීමට සමීක්ෂණ නිලධරයාට අයිතියක් ඇති බව.

(2) තම කාර්ය ඉටුකිරීමේ දී, යම් සමීක්ෂණ නිලධරයකුට බාධා කරන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් වන්නේ ය.

(3) (2 ) වන උපවගන්තිය යටතේ සමීක්ෂණ නිලධරයකුට බාධා කරමින් වරදකරු වූ තැනැත්තා ළමයාගේ හෝ යෞවනයාගේ කැපකරු මාපියන් වන අවස්ථාවක, ඒ උපවගන්තිය මගින් පනවනු ලබන

දණ්ඩනයට අමතරව, එම කැපකරු මාපියන් හට නිකුත් කරන ලද කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය ඇත්තේ ය.

කැපකරු මාපිය රැකවරණ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

**20**. (1) මණ්ඩලයේ මත ප්‍රකාශය ලැබීමෙන් අනතුරුව, ලබාදෙන රැකවරණය සහ ආරක්ෂාව ද, කැපකරු මාපියන් වෙත ලබා දී ඇති පාලනය ක්‍රියාත්මක වීම සහ කාර්ය සහ වගකීම් ඉටුකිරීම අදාළ ළමයාගේ හෝ යෞවනයාගේ සුභසිද්ධිය පිණිස නොවන බව අධිකාරියේ මතය වන අවස්ථාවක, කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිණිස අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමක් මත එම ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අධිකරණයට හැකි අතර අදාළ ළමයා හෝ යෞවනයා එම කැපකරු මාපියන්ගේ භාරයෙන් ඉවත් කොට අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන විකල්ප රැකවරණයක් ලබාදෙන ලෙස සමීක්ෂණ නිලධරයාට විධාන කිරීම ද අධිකරණයට කළ හැකි ය. කැපකරු මාපිය රැකවරණ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම මේ පනතේ දහ වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිය අනුව සිදු කළ යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක, එය ප්‍රත්‍යාදිෂ්ට කළ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත වෙනත් තැනැත්තකුගෙන් කැපකරු මාපිය රැකවරණය සඳහා ඉල්ලීමක් ලැබීමේ දී එම අධිකරණය විසින් අලුත් කැපකරු මාපිය රැකවරණ ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එම ඉල්ලීම සම්බන්ධයෙන් 13 වන වගන්තියේ සිට 19 වන වගන්තිය දක්වා වූ විධිවිධාන අදාළ විය යුතු ය.

ළමයකු කැපකරු මාපිය රැකවරණය යටතේ ඇත්නම් මිස, ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ දරුකමට හදාගැනීම සඳහා ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**21**. මේ පනතේ 7 වන වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් ළමයකු, මේ පනතේ 16 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ කැපකරු මාපිය රැකවරණ ආඥාවක් යටතේ වූ කැපකරු මාපිය රැකවරණයක පළමුවෙන් තබා ඇත්නම් මිස, සහ එසේ තබනතුරු ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත (61 වන අධිකාරය) යටතේ එවැනි ළමයකු දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීමක් කිසිම අධිකරණයක් විසින් භාර නොගත යුතු ය.

කැපකරු මාපිය රැකවරණ යටතේ සිටින ළමයකු දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීම.

**22**. (1) කැපකරු මාපියකු ඇතුළු යම් තැනැත්තකු ළමයකු දරුකමට හදාගැනීමට කැමතිව සිටින අවස්ථාවක, එම තැනැත්තා විසින් එම ළමයා දැනට පදිංචිව සිටින ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ තත් කාර්ය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර, අධිකරණය විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව, එම දරුකමට හදාගැනීම සඳහා බලය පවරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. කැපකරු මාපිය රැකවරණ ආඥාවක් කිරීමේ දින සිට එක් අවුරුදු කාලයක් ගතවනතුරු, කිසිම දරුකමට හදාගැනීමේ ආඥාවක් බලාත්මක නොවිය යුතු ය.

(2) කැපකරු මාපිය රැකවරණය මත ළමයකු තබනු ලැබූ දින සිට මාස නවයක කාලයක් ගතවීමෙන් පසු කවර හෝ අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ළමයකු, දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) යම් ළමයකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීම් එකකට වැඩි ප්‍රමාණයක් ඇති අවස්ථාවක, ළමයාගේ සුභසිද්ධිය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන ආඥාවක් ඊට කරනු ලැබිය හැකි ය.

(4) දිසා අධිකරණයක් විසින් ළමයකු දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී එම ළමයා සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවතින කැපකරු මාපිය රැකවරණ ආඥාව අලුත් කර ගැනීම සඳහා වූ ආඥාවක් වහාම නතර වන බවට සලකනු ලැබිය යුතු ය.

ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ 3 වන සහ 4 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු බව

**23**. (1) මේ පනතේ මේ කොටස යටතේ වූ දරුකමට හදාගැනීමක් සම්බන්ධයෙන් ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ 3 වන සහ 4 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය ; එසේ වුව ද, වයස අවුරුදු දහයට අඩු ළමයකු සම්බන්ධයෙන් වන විට අධිකාරියේ කැමැත්ත නොමැතිව දරුකමට හදා ගැනීමේ කිසිදු ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(2) ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට පත්වීමේ දී, දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ අදාළ ළමයාගේ කැපකරු මාපියන් විසින් වන අවස්ථාවක දී, කැපකරු මාපිය රැකවරණ කාලය තුළ දී එම ළමයාට අදාළව සමීක්ෂණ නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

උප්පැන්න සහතික නිකුත් කිරීම.

**24**. (1) 22 වන වගන්තිය යටතේ දරුකමට හදාගැනීම සඳහා වූ ආඥාවක් කරනු ලැබ ඇත්තේ, යම් ළමයකු සම්බන්ධයෙන් ද එම ළමයාට උප්පැන්න සහතිකයක් නොමැති අවස්ථාවක, එම ළමයාගේ උපන් දිනය දැනගැනීමට හැකි අවස්ථාව, එම උපන් දිනය අධිකරණය විසින් ඒ ආඥාවේ සඳහන් කළයුතු අතර, එම ළමයාගේ උපන් දිනය නොදන්නා අවස්ථාවක, එම ළමයාගේ අනුමාන උපන් දිනය බවට වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද සහතිකයක සඳහන් දිනය එම ළමයාගේ උපන් දිනය වශයෙන්, අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(2) දරුකමට හදාගැනීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් අධිකරණය විසින් ස්වකීය ආඥාව කිරීමෙන් පසු, අදාළ ළමයා සන්තකයෙහි උප්පැන්න සහතිකයක් නොමැති අවස්ථාවක, ළමයා හට උප්පැන්න සහතිකය වහාම නිකුත් කරන ලෙස අධිකරණය විසින් උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත විධාන කළ යුතු ය.

ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු බව.

**25**. මේ පනත යටතේ කරනු ලබන දරුකමට හදාගැනීමේ ආඥාවක්, ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා එම ආඥාපනත යටතේ කරන ලද දරුකමට හදාගැනීමේ ආඥාවක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, එම ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම ආඥාවට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරය පනත නොතකා අධිකාරිය ක්‍රියා කළ යුතු බව.

**26**. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ මේ කොටස යටතේ එම අධිකාරිය වෙත පවරනු ලැබ ඇති කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට අධිකාරියට බලය ඇත්තේ ය.

අර්ථ නිරූපණය.

**27**. මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ ;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නෙන් (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති වෛද්‍ය වෘත්තිකයකු අදහස් වේ ; සහ

"යෞවනයා" යන්නෙන් වයස අවුරුදු දහඅටට එළඹ ඇති එහෙත් වයස අවුරුදු විසිඑකකට අඩු තැනැත්තකු අදහස් වේ.

## III වන කොටස

## කාලවරෝධිවීම

**28**. (1) සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකුගේ දේපළවල සන්තකය පවත්වාගෙන යාම වළක්වාලනු ලැබූ විට, 2004 දෙසැම්බර් මස 26 වන දින සිට එක් අවුරුද්දක කාලයකට 2004 දෙසැම්බර් මස 26 වන දිනට පෙර ආරම්භ වූ සුනාමි විපතෙන් හානියට පත් තැනැත්තකුගේ නිශ්චල දේපළවල ප්‍රතිකූල සන්තකයට බාධා වූවක් ලෙස නොසැලකිය යුතු ය.

ප්‍රතිකූල සන්තකයට බාධාවක් නොවන බවට සැලකිය යුතු බව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ නිශ්චල දේපළවල සන්තකය, 2004 දෙසැම්බර් මස 26 වන දින සිට 2005 දෙසැම්බර් මස 26 වන දින දක්වා වූ කාලය තුළ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් විසින් දරනු ලැබීමේ හේතුව නිසාම පමණක්, (1) වන උපවගන්තියේ සඳහන් එම තැනැත්තාගේ නිශ්චල දේපළෙහි සන්තකයට බාධාවක් ඇති වූවා සේ සලකනු නොලැබිය යුතු ය.

**29**. යම් ලිඛිත නීතියක් මගින් යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක යම් නඩුවක්, අභියාචනයක් හෝ ඉල්ලීමක් පැවරීමට හෝ ගොනු කිරීමට නියම කරනු ලැබ ඇති කාලසීමාව ගණන් බැලීමේ දී හෝ යම් ලිඛිත නීතියක් මගින් නියමිත කාලයක් තුළ යම් ක්‍රියාවක් කළ යුතු බවට නියම කර ඇති අවස්ථාවක, එම නඩුව පැවරීමට හෝ ගොනු කිරීමට නැතහොත් නියමිත කාලයක් තුළ එම විශේෂිත ක්‍රියාව සිදුකිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තා සුනාමි විපතින් හානියට පත් තැනැත්තෙක් නම් සහ සුනාමි විපතේ ප්‍රතිඵලයක් වශයෙන් එම තැනැත්තාට එම පියවර ගැනීමට නොහැකි වූයේ නම්, 2004 දෙසැම්බර් මස 26 වන දිනයෙන් ආරම්භ වී 2005 දෙසැම්බර් මස 26 වන දිනයෙන් අවසන් වන කාලසීමාව අත්හරිනු ලැබිය යුතු ය.

ඇතැම් නඩු ආදිය පැවරීම සඳහා නියම කරන ලද කාලය ගණන් බැලීමේ දී ඇතැම් කාලසීමාවන් අත්හැරීම.

## IV වන කොටස

## ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ ඇති නඩු

**30**. (1) 2004 දෙසැම්බර් මස 26 වන දින සිට 2005 දෙසැම්බර් මස 26 වන දින දක්වා වූ කාලසීමාව තුළ කවර හෝ අවස්ථාවක 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ සුනාමි විපතින් හානියට පත් ප්‍රදේශයක පිහිටි ඉඩමකට අදාළ තොරතුරු ගොනු කරනු ලැබ, ඉඩමේ සන්තකය හිමිවිය යුත්තේ කවර

සුනාමි විපතින් හානියට පත් ඉඩම්වල සන්තකය.

තැනැත්තකුට ද යන්න තීරණය කිරීම සඳහා එම අධිකරණය විසින් විභාගයක් පවත්වනු ලබන අවස්ථාවක, එම පනතේ 68 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2004 දෙසැම්බර් මස 26 වන දින ඉඩමේ සන්තකය දරමින් සිටි තැනැත්තා හෝ එම තැනැත්තා මියගොස් හෝ අතුරුදහන් වී ඇති අවස්ථාවක, එම තැනැත්තා සමග එම ඉඩමේ සන්තකය දරමින් සිටි යම් තැනැත්තකු හෝ තැනැත්තන් එම ඉඩමේ සන්තකය දරමින් සිටි තැනැත්තා හෝ තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු අතර එම ඉඩමේ සන්තකය දැරීමට එම තැනැත්තාට හෝ තැනැත්තන්ට හිමිකම් ඇති බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ඉඩමක සන්තකය දරමින් සිටි යම් තැනැත්තකු හෝ තැනැත්තන්, එම උපවගන්තිය යටතේ එම ඉඩමේ සන්තකය දරමින් සිටි බවට සලකනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් විසින් 2004 දෙසැම්බර් මස 26 වන දිනට පෙර මාස දෙකක කාලයක් ඇතුළත කවර හෝ අවස්ථාවක බලහත්කාරයෙන් සන්තකයෙන් නෙරපනු ලැබ ඇති අවස්ථාවක, එසේ සන්තකයෙන් නෙරපනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ට එම ඉඩමේ සන්තකය නැවත ලබාදෙන ලෙස විනිශ්චයකාරවරයා විසින් විධාන කළ යුතු අතර නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක අධිකාරය යටතේ මිස, එම සන්තකයට බාධා කිරීම තහනම් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## පරිශ්‍රවල කුලී නිවැසියන්

කුලී නිවැසියන්ගේ හෝ බදු හිමියන්ගේ අයිතීන් තහනම් නොකිරීම.

**31**. යම් තැනැත්තකු 2004 දෙසැම්බර් මස 26 වන දින, සුනාමි විපතින් හානියට පත් පරිශ්‍රවල හෝ ඉඩමක කුලී නිවැසියන්ව හෝ බදුහිමියන්ව සිටිය විට, කුලියේ හෝ බද්දේ විෂය වස්තුව විනාශ වූ පමණින්ම හෝ සිටීමට හෝ සන්තකයට නුසුදුසු වූ පමණින්ම, ඔහුගේ කුලී නිවැසියාව හෝ බදු අයිතිය තහනම් නොවේ.

## VI වන කොටස

## සුනාමි සහනාධාර දේපළ සම්බන්ධයෙන් වූ වැරදි

**32**. සුනාමි සහනාධාර වශයෙන් අදහස් කරන ලද මුදල් ඇතුළු යම් චංචල දේපළකට අදාළව දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව, සාපරාධී ව්‍යාපහරණය, සාපරාධී විශ්වාස භාරය කඩකිරීම, සොරකම, ත්‍රාසද්ග්‍රහණය, කොල්ලකෑම, වංචා කිරීම සහ සොරකම් කරන ලද දේපළ තබාගැනීම යන වැරදි සිදු කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී එම තැනැත්තා එසේ වරදකරු කරනු ලැබීමේ දී දණ්ඩ නීති සංග්‍රහය යටතේ එම වරද සඳහා පනවනු ලැබිය හැකි දඬුවම මෙන් දෙගුණයකට සමාන දඬුවමකට ඔහු යටත් විය යුතු ය.

සුනාමි සහනාධාර දේපළවලට අදාළව සිදු කරනු ලබන දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ ඇතැම් වැරදි සඳහා දණ්ඩන.

**33**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පළමුවන උපලේඛනය [2 වන වගන්තිය]

පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, එනම් :—

1. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොළඹ, තිඹිරිගස්යාය, දෙහිවල, මොරටුව සහ රත්මලාන.
2. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීගමුව සහ වත්තල.
3. කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ පානදුර, කළුතර සහ බේරුවල.
4. ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බෙන්තොට, බලපිටිය, අම්බලන්ගොඩ, හික්කඩුව, ගාලු කඩවත් සතර සහ හබරාදූව.
5. මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැලිගම, මාතර කඩවත් සතර, දෙවිනුවර සහ දික්වැල්ල.
6. හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමය, හම්බන්තොට, අම්බලන්තොට සහ තංගල්ල.
7. යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ උතුරු දූපත (කයිට්ස්), කරවෙඩ්ඩි, පේදුරු තුඩුව, චාවකච්චේරිය, කරෙයිනගර්, මරුතන්කනි, තෙලිප්පලෙයි, සහ ඩෙල්ෆ්ට්
8. මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ පුතුකුඩියුරුප්පු, සහ මරිතෙම්පත්තු.

9. කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කයේ කන්ඩවලෙයි සහ පුනක්කාරි.

10. මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ මැද කෝරලේ පත්තුව, වෙන්කලාඩි, වාලච්චිනෙයි, කලවන්චිකුඩි, එරවූර් නගරය, උතුරු මන්මුනෙයි, වහාරන්, කාත්තන්කුඩි, අරියම්පති, කිරාන්, වෙල්ලවේලි, පදිපලෙයි, වච්නාතිව් සහ ඔට්ටමාවඩි.

11. අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ කල්මුනේ, සයින්තමරාතු, කාරතිව්, නින්තවූර්, අඩලාච්චනෙයි, අක්කරයි පත්තු, අලයාඩිවෙම්බු, තිරුක්කොවිල්, පොතුවිල් සහ ලාහුගල.

12. ත්‍රිකුණාමල පරිපාලන දිස්ත්‍රික්කයේ කුච්චවේලි, ත්‍රිකුණාමල නගරය සහ කඩවත්, තම්පලාගමුව, කින්යා, මුත්තූර්, සේරුවිල, වෙරුගල්/එච්චිලම්පත්ති.

13. පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව.

දෙවන උපලේඛනය [3 (2) වන වගන්තිය]

**ග්‍රාම නිලධාරි වෙත.**

අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම :—
2. ස්ත්‍රීපුරුෂ භාවය :—
3. ජාතිය :—
4. වයස :—
5. මියගිය දිනය :—
6. අවසන්වරට පදිංචි ස්ථානයේ ලිපිනය :—
7. ස්ථිර වාසස්ථානයේ ලිපිනය :—
8. නිලය හෝ රැකියාව :—
9. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :—
10. ඉල්ලුම්කරුගේ පදිංචි ස්ථානය සහ දුරකථන අංකය :—
11. ඉල්ලුම්කරුගේ වෘත්තිය/රැකියාව :—
12. ඉල්ලුම්කරුගේ සේවාස්ථානය සහ දුරකථන අංකය :—
13. ඉල්ලුම්කරු, අතුරුදහන් වූ තැනැත්තාට ඇති සම්බන්ධය :—

......................පදිංචි......................වන මා විසින්...................(අතුරුදහන් වූ තැනැත්තාගේ නම) යන අය මාසහයකට වඩා වැඩි කාලයක සිට අතුරුදහන්ව ඇති බව සහ එකී...............යන අය සුනාමි විපත හේතුවෙන් මියගොස් ඇති බවට සැබැවින්ම විශ්වාස කරන බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

එම නිසා මා විසින් එකී මරණය, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අතර එකී මරණය පිළිබඳව මරණ සහතිකය මා වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

දිනය : ඉල්ලුම්කරුගේ අත්සන

තුන්වන උපලේඛනය [9 (1) වන වගන්තිය]

පරිවාස හා ළමා ආරක්ෂක කොමසාරිස් වෙත.

**ළමයකුගේ වර්තමාන භාරකරු වශයෙන් ලියාපදිංචි වීම සඳහා ඉල්ලීම**

ඉල්ලුම්කරුගේ විස්තර

1. නම :—
2. ලිපිනය :—
3. උපන් දිනය :—
4. ස්ත්‍රී පුරුෂ භාවය :—
5. හැඳුනුම්පත් අංකය :—
6 ආගම :—
7 වෛවාහක තත්වය :—
8. විවාහක නම් කලත්‍රයාගේ නම :—
9. වෘත්තීය/රැකියාව :—
10. ඉල්ලුම්කරුට ළමයාගේ ඥාති සම්බන්ධයක් ඇතිනම්, එම සම්බන්ධතාවය :—
11. ළමයා ඉල්ලුම්කරුගේ භාරයට ගත් දිනය :—
12. ඉල්ලුම්කරුට ළමයා හමු වූ ස්ථානය සහ හමු වූ ආකාරය :—
13. ළමයාගේ මාපියකු/මාපියන් ජීවත් සිටීද නැද්ද යන්න ඔබ දන්නේ ද?:—
14. ළමයාගේ මාපියකු/භාරකරුවකු සොයා ගැනීමට ඔබ උත්සාහ කර ඇද්ද ?:—
15. ඔබ විවාහක නම්, වර්තමාන භාරකරු වශයෙන් ළමයා ඔබ යටතේ රඳවා ගැනීම සඳහා ඔබගේ කලත්‍රයා ඔබ සමග එකඟ ද?:—

එසේ එකඟ නම් කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක් ඉදිරිපත් කරන්න.

ළමයාගේ විස්තර

1. නම :—
2. ස්ත්‍රී පුරුෂ භාවය :—
3. උපන් දිනය (දන්නේ නම්) :—
4. ලිපිනය (දන්නේ නම්) :—
5. දෙමාපියන්ගේ නම (දන්නේ නම්) :—
6. ළමයාගේ මාපියකු/මාපියන් ජීවත්ව සිටින බව ඔබ දන්නේ ද? :—

ඉහත තොරතුරු මාගේ උපරිම දැනීමේ ආකාරයට සත්‍ය සහ නිවැරදි බවට මම මෙයින් සහතික කරමි.

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :

හතරවන උපලේඛනය [13(1) වන වගන්තිය]

## කැපකරු මාපිය රැකවරණ නියෝගයක් නිකුත් කිරීම සඳහා ඉල්ලීම

මහෙස්ත්‍රාත් අධිකරණය වෙත

මෙහි පහත අත්සන් කරනු ලබන................................හි පදිංචි.......................වන මම/අපි පහත සඳහන් ලෙස ප්‍රකාශ කරමි—

1. 2005 අංක 16 .දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ 16 වන වගන්තිය යටතේ ළමයකුගේ/යෞවනයකුගේ ...................... (ළමයාගේ/යෞවනයාගේ නම) කැපකරු මාපියකු/හෝ මාපියන් වශයෙන් මම/අපි පත්වීමට කැමැත්තෙන් සිටින බවත් ; හෝ

2. එම පනත යටතේ කැපකරු මාපියකු වීමට මම/අපි විසින් වෙනත් යම් ඉල්ලීමක් කර නොමැති බවත් ; සහ හෝ....................................................................මම/අපි විසින් එම පනත යටතේ කැපකරු මාපියකු ලෙස පත්වීමට ඉල්ලීමක් කර ඇති බවත් සහ එම ඉල්ලීම.........................................................................................මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින බවත් ; සහ/හෝ...................................වන දින......................................මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරන ලද කැපකරු මාපිය ආඥාව මගින්..............................................මම/අපි(ළමයාගේ/යෞවනයාගේ) කැපකරු මාපිය ලෙස පත් කර ඇති බවත් ; සහ/හෝ..................ඉහත සඳහන් පනත යටතේ..........................................දිස්ත්‍රික් උසාවිය මගින්/ඉදිරියේ දරුකමට හදා ගැනීමේ ආඥාවක් කර ඇති බවත්/විභාග වෙමින් පවතින බවත්,

3. ළමයකුගේ/යෞනයකුගේ කැපකරු මාපිය රැකවරණය ප්‍රදානය කරනු ලැබුවහොත්, මම/අපි පහත සඳහන් කරුණුවලට එකඟ වෙමි/එකඟ වෙමු.

(අ) ළමය/යෞවනයා සම්බන්ධයෙන්, මම/අපි ඔහුගේ/ඇයගේ දෙමාපියන් මෙන් ඔහුට/ඇයට අධ්‍යාපනය ඇතුළුව රැකවරණය සහ ආරක්ෂාව සැපයීම, වගකීම ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සහ ඉටු කිරීමට

(ආ) පනත යටතේ සමීක්ෂණ නිලධරයාගේ කාර්ය ඉටුකිරීම සඳහා අපගේ නිවසට හෝ ළමයා/යෞවනයා පදිංචිව සිටින වෙනත් ස්ථානයකට පැමිණීමට ඔහුට අවසර දීමට

(ඇ) මානසික වශයෙන් කම්පනයකට පත්ව සිටින ළමයාගේ/යෞවනයාගේ රැකවරණය පිළිබඳව ලබාදෙන යම් පුහුණුවකට සහභාගි වීමට

(ඈ) කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත්, ළමයාගේ/යෞවනයාගේ භාරකාරත්වය සමීක්ෂණ නිලධරයාට භාරදීමට.

සාක්ෂි වශයෙන් මෙම ඉල්ලීම .2005......................... මස .................... වන දින මම/අපි විසින් අත්සන් කරන ලදී.

ඉල්ලුම්කරුගේ නම :— ඉල්ලුම්කරුගේ අත්සන

කලත්‍රයාගේ නම :— කලත්‍රයාගේ අත්සන

දිනය :— දිනය :—

පස්වන උපලේඛනය [13 (1) වන වගන්තිය]

13 වන වගන්තිය යටතේ තොරතුරු

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙතට**

ඉල්ලුම්කරුට කැපකරු මාපියකු වීමේ යෝග්‍යතාව අගැයීමට 2005 අංක. 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ, පහත සඳහන් තොරතුරු මෙසේ ඉදිරිපත් කරනු ලැබේ :—

**ඉල්ලුම්කරු සම්බන්ධ තොරතුරු**

1. නම :— මහතා/මහත්මිය/මෙනවිය

2. ලිපිනය :—

3. උපන් දිනය අවුරුද්ද/මාසය/දිනය :—

| | | |
|---|---|---|
| | | |

4. ඉල්ලුම් කරන දිනට වයස :—

| |
|---|
| |

5. ස්ත්‍රී/පුරුෂ භාවය පි/ගැ :—

6. ආගම :—

7. ජා. හැ. අංකය :—

8. වෛවාහක තත්ත්වය විවාහක/අවිවාහක දික්කසාද බව :—

9. (අ) දැනට කරනු ලබන රැකියාව සහ මාසික වැටුප :—

(ආ) ඔබ කොපමණ කාලයක සිට මෙම රැකියාවේ යෙදී සිටින්නේ ද ? :—

(ඇ) කලින් රැකියාවක් කලේ නම් එම රැකියාව :—

**කලත්‍රයා පිළිබඳ විස්තර**

10. කලත්‍රයාගේ නම :—

11. විවාහ වූ දිනය :— අවු/මා/දි

| | | |
|---|---|---|
| | | |

12. කලත්‍රයාගේ උපන් දිනය :— අවු/මා/දි

| | | |
|---|---|---|
| | | |

13. දැනට කරන රැකියාව සහ මාසික වැටුප:—

14. ළමයින් සිටී නම් ඔවුන්ගේ නම් සහ වයස :—

## වර්තමාන භාරකරු ලියාපදිංචි කිරීම

15. මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබගේ කලත්‍රයාගේ කැමැත්ත ප්‍රකාශ කර ඇත්තේ ද ? ඔව්/නැත
(කරුණාකර කැමැත්ත පළකිරීමේ ලිපිය අමුණන්න)

16. ඔබ දැනට සුනාමි විපත බලපෑ ළමයකු භාරයේ තබාගෙන සිටින්නේ ද?:— ඔව්/නැත

17 පිළිතුර "ඔව්" වේ නම්, ඔබ දැනටමත් ළමයාගේ වර්තමාන භාරකරුවකු වශයෙන් ලියාපදිංචි වී සිටින්නේ ද ? ඔව්/නැත

18. පිළිතුර "ඔව්" වේ නම් ලියාපදිංචි වූ දිනය සහ පළාත සහ ලියාපදිංචි අංකය :—

19. ඔබ වර්තමාන භාරකරුවකු නම්, දැනට ඔබගේ භාරයේ සිටින ළමයාගේ කැපකරු මාපියකු වශයෙන් ඉල්ලුම් කිරීමට ඔබ කැමැත්තේ ද? :— ඔව්/නැත

## ළමයා/යෞවනයා සම්බන්ධ තොරතුරු

20. ඔබ කැපකරු මාපියකු වශයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වන්නා වූ ළමයා/යෞවනයා හඳුනාගෙන සිටින්නේ ද ? ඔව්/නැත

21. (i) පිළිතුර "ඔව්" වේ නම්

(අ) ළමයාගේ/යෞවනයාගේ නම :—

(ආ) වර්තමාන ලිපිනය :—

(ඇ) වයස දන්නේ නම් වයස :—

(ඈ) ස්ත්‍රී/පුරුෂ භාවය :—

(ඉ) ඔබ දන්නා ආකාරයට ළමයාට/යෞවනයාට සහෝදර සහෝදරියන් සිටින්නේ ද ? :—

(ඊ) එසේ සිටී නම්, ඔබ කැපකරු මාපියකු වශයෙන් එම සහෝදර සහෝදරියන් ද ඔබගේ රැකවරණය යටතට ගැනීමට කැමැත්තේ ද ? :—

(උ) ඔබගේ දැනුම අනුව ළමයාගේ/යෞවනයාගේ මාපියකු ජීවතුන් අතර සිටී ද? :—

(ඌ) පිළිතුර "ඔව්" නම් එම මාපියාගේ ලිපිනය සඳහන් කරන්න :—

(එ) එම මාපියා මෙම ඉල්ලීමට කැමැත්ත පළ කරන්නේ ද ? :—

(ඒ) ළමයා/යෞවනයා ඔබ කොපමණ කලක සිට හඳුනන්නේ ද? :—

(ඔ) ළමයා/යෞවනයා ඔබ හඳුනාගත්තේ කෙසේ ද ?

(ඕ) ළමයාට/යෞවනයාට ඔබගේ නෑදෑකමක් තිබේ ද?

(ක) සුනාමි විපත සිදුවීමට පෙර ඔබ ළමයා/යෞවනයා හඳුනන්නේ ද?

(ග) සුනාමි විපත සිදුවීමට පෙර ඔබ ළමයාගේ/යෞවනයාගේ දෙමාපියන් හඳුනන්නේ ද? :—

(ච) ළමයාගේ මාපියකු/මාපියන් ජීවතුන් අතර සිටින බව ඔබ දන්නේ ද ?

(ජ) එසේ නම්, ඔවුන් පදිංචිව සිටි ස්ථානය සඳහන් කරන්න :—

(ii) පිළිතුර "නැත" යන්න නම් පහත සඳහන් කරුණු සඳහන් කරන්න :—

(අ) ඔබ, ළමයකු හෝ යෞවනයකු ඇති දැඩි කිරීමට කැමැත්තේ ද? ළමයකු/යෞවනයකු

(ආ) ඔබ කැමති වයස කුමක් වන්නේ ද ?

(ඇ) ඔබ කැමති ස්ත්‍රී/පුරුෂ භාවය :— ස්ත්‍රී/පුරුෂ

22. ඔබ යෞවනයකු ඇතිදැඩි කිරීමට කැමැත්තේ නම්, ඔබට කවර කාලයක් සඳහා කැපකරු මාපිය රැකවරණ ආඥාව ක්‍රියාත්මක වීම අවශ්‍ය ද ? :— අවුරුදු එකයි/යෞවනයා වයස අවුරුදු............එළඹෙන තුරු.

23. ඔබ හෝ ඔබේ කලත්‍රයා ඊළඟ වර්ෂයේ දී විදේශ රැකියාවක් සඳහා පිටරට යාමට අපේක්ෂා කරන්නේ ද ? :— ඔව්/නැත

24. ඔබ යම් අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ ඇත්තේ ද? :— ඔව්/නැත පිළිතුර "ඔව්" වේ නම්, වරද සහ ලැබුණු දඬුවම සඳහන් කරන්න.

25. ඔබ යම් අධිකරණයක් ඉදිරිපිට දී චෝදනා ලැබ සිටින්නේ ද? :— පිළිතුර "ඔව්" වේ නම්, වරද සඳහන් කරන්න

26. ආරවුලක් නිරවුල් කර ගැනීම සඳහා ඔබ සමථ මණ්ඩලය වෙත ගොස් ඇත්තේ ද?:— පිළිතුර "ඔව්" නම්, ආරවුලේ ස්වභාවය සඳහන් කරන්න.

. ..............................................

දිනය: ඉල්ලුම්කරුගේ අත්සන

හයවන උපලේඛනය [14(5) වන වගන්තිය]

## කැපකරු මාපියකු වීම සඳහා ඉල්ලුම්කරුවකුගේ යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා වූ මාර්ගෝපදේශයන්

1. හැකිතාක් දුරට ළමයා—

   (අ) ළමයා නොදන්නා තැනැත්තන්ට වඩා, ව්‍යාප්ත පවුලක් හෝ ළමයා හඳුනන තැනැත්තන් සමග ;

   (ආ) ස්ථානය වෙනස් කිරීම අවම කර, ළමයාට පුරුදු පරිසරය හෝ ජනසමාජය තුළ ;

   (ඇ) ළමයාගේ පාරම්පරික අයිතිවාසිකම්වලට ඉතා සමීප, ළමයාගේ ජනවාර්ගික සහ ආගමික ජන කොට්ඨාසයට අයත් කැපකරු මාපියන් සමග ;

   (ඈ) ළමයාගේම සංස්කෘතික සහ භාෂා පසුබිමක් ඇති කැපකරු මාපියන් සමග ;

   (ඉ) තම සහෝදර සහෝදරියන් සමග,

සිටිය යුතු ය.

2. යුවලක් සඳහා ප්‍රමුඛත්වය දිය යුතු ය. කෙසේ වුවද, මෙහි දක්වා ඇති අන් සියලුම මාර්ගෝපදේශවලට නිසි පරිදි සැලකිල්ලක් ලබා දීමෙන් පසු ළමයාගේ සුභසිද්ධිය උදෙසා වන්නේ නම්, එක් මාපියකු වුවද සලකා බැලිය යුතු ය.

3. කැපකරු මාපියකු සහ ළමයා අතර වයස් පරතරය අවුරුදු 25 සිට 45 දක්වා විය යුතු ය.

4. යුවලක් අවුරුදු තුනකට වඩා වැඩි කාලයක් සඳහා නීත්‍යානුකූලව විවාහ වී සිටිය යුතු ය.

5. පහත දැක්වෙන තැනැත්තන් කැපකරු මාපියන් ලෙස සලකනු නොලැබිය යුතු ය.

   (අ) ළමයා නිසි පරිදි හදාවඩා ගැනීමට බාධකයක් වන මත්පැන්වලට ඇබ්බැහිව සිටීමේ, මත්ද්‍රව්‍ය අනිසි ලෙස පාවිච්චි කිරීමේ, ශාරීරික, මානසික හෝ චිත්තවේගාත්මක දුර්වලතාවකින් පෙළීමේ ඉතිහාසයක් සහිත තැනැත්තන් ;

   (ආ) හිංසනයට පාත්‍රවීමේ ඉතිහාසයක් ඇති හෝ ළමා කාලයේ දී ළමාරක්ෂක සේවා ලාභියකුව සිටි තැනැත්තන් ;

   (ඇ) යම් වරදකට වරදකරුවී ඇති තැනැත්තන් හෝ පොලිස් වාර්තාවක් ඇති තැනැත්තන් ;

   (ඈ) රැකියාව සඳහා හෝ වෙනත් හේතුවක් නිසා දීර්ඝ කාලයක් පිටරට යාමට අදහස් කරන තැනැත්තන්.

6. කැපකරු මාපිය පවුල, ඉල්ලුම්කාර දෙමාපියන්ගෙන් සාර්ථකව දෙමාපිය කටයුතු ඉටුකිරීමේ හැකියාව සහ වෛවාහික සමගිය ප්‍රදර්ශනය වන සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය රහිත ස්ථාවර පවුලක් විය යුතු ය.

7. මෙහි දක්වා ඇති වෙනත් මාර්ගෝපදේශ නිසි පරිදි සැලකිල්ලට ගැනීමෙන් පසු ළමයාගේ සුබසිද්ධිය උදෙසා රඳවා තබන්නේ නම් මිස, මෑතක දී ළමයකු මියගිය පවුලක් සැලකිල්ලට නොගත යුතු ය.

8. කැපකරු මව්පියන් —

(අ) චිත්ත කම්පනයට පත්වී ඇති ළමයකු හෝ යෞවනයකු සඳහා රැකවරණයදී ම සම්බන්ධයෙන් පුහුණුවක් ලැබීමට කැමති විය යුතු ය;

(ආ) සෞඛ්‍යය, ආරක්ෂක වගකීම් සැලසීම පිළිබඳ පුහුණුවක් ලැබීමට කැමති හා හැකියාව ඇති අය විය යුතු ය;

(ඇ) අගැයීමේ සහ සමීක්ෂණය කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රශ්න කරනු ලැබීමට හෝ පැමිණීමට ඉඩදීමට එකඟ විය යුතු ය.

9. අදාළ නිවස —

(අ) එම නිවසේ පදිංචි පවුලේ සියලුම සාමාජිකයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබිය යුතු ය ;

(ආ) ළමයාගේ වයසට ගැලපෙන පරිදි මනා පවිත්‍රතාව, සෞඛ්‍ය සම්පන්න බව සහ ආරක්ෂාව සහිතව හොඳ ප්‍රමිතියකින් පවත්වාගෙන යා යුතු ය.

10. කැපකරු මාපියන් විසින් පහත සඳහන් දේ සැපයීමේ හැකියාවක් තිබිය යුතු ය.

(අ) ප්‍රමාණවත් ප්‍රාථමික සහ නිවාරණ සෞඛ්‍ය රැකවරණය;

(ආ) ළමයාගේ හෝ යෞවනයාගේ ශාරීරික, මානසික, චිත්ත සහ සමාජ සංවර්ධනය සපුරාලන සෞඛ්‍යය රැකවරණ අවශ්‍යතා සැපයීම ;

(ඇ) ළමයාගේ හෝ යෞවනයාගේ සම්පූර්ණ වර්ධනය සඳහා අවශ්‍ය පෝෂ්‍යදායක ආහාර සැපයීම.

11. ළමයාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් සලසනු ලබන බව සහතික වීමට කැපකරු මාපියන් හට හැකි විය යුතු ය.

12. ළමයාගේ ශුභ සාධනය සඳහා සාධාරණ ලෙස ප්‍රයෝගික නොවන්නේ නම් මිස, හෝ ඊට අනුකූල නොවන්නේ නම් මිස හෝ ව්‍යාප්ත පවුල සහ එම පවුලේ මිතුරන් සමග සම්බන්ධතා පවත්වා ගෙන යාමට සහ ප්‍රවර්ධනය කිරීමට, ළමයාට හෝ යෞවනයාට අවස්ථාව ලබාදීම සඳහා කැපකරු මව්පියන් කැමැත්තෙන් සිටිය යුතු ය.

13. ළමයාගේ සිතුම් පැතුම්වලට ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්විය යුතු ය ;

14. මාපිය රැකවරණ කාලසීමාවෙන් අනතුරුව, ඉල්ලුම්කරු ළමයා දරුකමට හදා ගැනීමට දක්වන කැමැත්ත සැලකිල්ලට ගත යුතු ය.

ඉහත මාර්ගෝපදේශ අදාළ කර ගැනීමේ දී මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණ සහ විමර්ශන පවත්වනු ලැබිය හැකි ය.

හත්වන උපලේඛනය [15 (2) වන වගන්තිය]

**සමීක්ෂණ නිලධරයා තෝරාගත යුත්තේ කවර ධුර දරන තැනැත්තන් අතරින් ද යන වග**

පරිවාස නිලධරයන්

ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ නිලධරයන්

විදුහල්පතිවරුන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක කමිටුවල සමායෝජකයන්

අටවන උපලේඛනය [16(1) වගන්තිය]

..........................................**මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය**

නඩු අංක :

**කැපකරු මාපිය රැකවරණ ආඥාව සහ කොන්දේසි**

(කැපකරු මව්පිය/මව්පියන්ගේ නම)

(ලිපිනය)

1. මේ ආඥාවේ දින සිට එක් අවුරුද්දක කාලයක් සඳහා ඔබ..................................(ළමයාගේ/යෞවනයාගේ නම) ගේ කැපකරු මාපිය/ මාපියන් ලෙස මෙයින් පත්කරනු ලැබේ. මේ ආඥාවේ දින සිට එකී...............................(ළමයාගේ/යෞවනයාගේ නම) වයස අවුරුදු..............................ට එළඹෙන දිනය වන................................දිනය දක්වා, එම යෞවනයාගේ කැපකරු මාපිය/මාපියන් ලෙස මෙයින් පත් කරනු ලැබේ.

හෝ

ඔබ..........................................(ළමයාගේ/යෞවනයාගේ නම) ගේ කැපකරු මාපිය/මාපියන් ලෙස එක් අවුරුද්දක් සඳහා පත්කරමින්...............................දින දී කරන ලද කැපකරු රැකවරණ ආඥාව..............................දින සිට තවදුරට එක් අවුරුද්දක් සඳහා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

2 මෙම පත්වීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබේ :—

(අ) ඔබ ළමයාගේ/යෞවනයාගේ සැබෑ දෙමාපියන් මෙන් එම ළමයාට/ යෞවනයාට අධ්‍යාපනය සැලසීම, සහ ඔහුට සිදුවූ බලවත් චිත්ත කම්පනය සැලකිල්ලට ගෙන අවශ්‍ය විය හැකි විශේෂ රැකවරණ ඇතුළු රැකවරණ සහ ආරක්ෂාව සලසන බවටත් සියලු පාලන කටයුතු ක්‍රියාත්මක කරන බවටත් සියලු වගකීම් ඉටු කරනු ලබන බවට ; සහ

(ආ) ඔබ විසින් සපයනු ලබන කැපකරු මව්පිය රැකවරණය පිළිබඳ වාර්තා කිරීම සඳහා සමීක්ෂණ නිලධරයාට අවශ්‍ය වන සියලු සහාය සහ සහයෝගය ඔබ විසින් ලබා දෙන බවට සහ එම කාර්ය සඳහා දවසේ කවර හෝ අවස්ථාවක දී ළමයා / යෞවනයා නැවතී සිටින පරිශ්‍රයට ඇතුළුවීම හා තත්කාර්ය සඳහා අවශ්‍ය පරිදි යම් තැනැත්තකු හෝ යම් ස්ථානයක් පරීක්ෂා කිරීමට බලයලත් නිලධරයාට අවසර දෙන බවට.

3. ඉහත සඳහන් කොන්දේසි කිසිවක් කඩකළහොත් කැපකරු මාපිය රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

4. (අ) මෙම ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කළහොත් ;

(ආ) මෙම ආඥාව අවසාන වුවහොත් ;

(ඇ) මෙම ආඥාව නතර කළහොත්.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නම් කරනු ලබන නිලධරයකුට ළමයා/ යෞවනයා භාර දීමට ඔබට නියම කරනු ලැබේ.

5..................................සමීක්ෂණ නිලධරයා ලෙස මෙයින් පත් කරනු ලැබේ.

මහෙස්ත්‍රාත්වරයාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය :

නව වන උපලේඛනය [18(1) වන වගන්තිය]

## කැපකරු මාපිය රැකවරණ වාර්තාව

පළාත : වාර්තාව අදාළ වන කාලය :

කැපකරු මාපිය රැකවරණ ආඥාව

| ආඥාව කළ දිනය | | | | ආඥාව අවසන් වන දිනය | | | |
|---|---|---|---|---|---|---|---|

පාර්ශ්වයන්ගේ නම්:

කැපකරු මාපියාගේ/මාපියන්ගේ නම :

කැපකරු ළමයාගේ/යෞවනයාගේ නම :

ලිපිනය :

(1) පහත සඳහන් දෑ පිළිබඳ ප්‍රකාශ

(අ) යෝග්‍ය මාපියාගේ/මාපියන්ගේ සහ පවුලේ ලක්ෂණ :

(ආ) නිවස පිහිටි පරිසරයේ ස්වභාවය :

(ඇ) සෞඛ්‍ය රැකවරණය :

(ඈ) අපචාරවලින් සහ නොසලකා හැරීමෙන් ආරක්ෂිත බව

(ඉ) අධ්‍යාපනික පහසුකම් :

(ඊ) කුසලතා සංවර්ධනය :

(උ) ළමයාගේ අයිතිවාසිකම් සුරැකීම :

(ඌ) ව්‍යාප්ත පවුල සහ මිත්‍රයන් සමග ආශ්‍රයන් පවත්වාගෙන යාම :

(එ) කැපකරු ළමයකු/යෞවනයකු ගේ විශේෂ විස්තර/සෝදිසි කිරීම් :

(2) ළමයකුගේ උපරිම සුභ සිද්ධිය සඳහා කටයුතු කර තිබේද :

සමීක්ෂණ නිලධරයාගේ නම සමීක්ෂණ නිලධරයාගේ අත්සන

දිනය :

දහවන උපලේඛනය [20 (1) වන වගන්තිය]

## කැපකරු රැකවරණ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම

පළාත :

(කැපකරු මා පිය/මා පියන්ගේ නම) :

(ලිපිනය:)

..........................................(කැපකරු ළමයාගේ/යෞවනයාගේ) ගේ, කැපකරු මාපිය/මාපියන් ලෙස ඔබව පත් කරමින්...............................(ආඥාව කළ දිනය සඳහන් කරන්න.) දින කරන ලද කැපකරු ආඥාව වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

ඔබේ භාරකාරත්වයෙන් ඔහු/ඇය ඉවත්කර ගැනීමට බලය දී ඇති ................................(බලයලත් සමීක්ෂණ නිලධරයාගේ නම) යන අයට නොපමාව එකී ළමයාගේ/යෞවනයාගේ භාරකාරත්වය පවරන ලෙසට මෙයින් නියම කරනු ලැබේ.

දිනය : මහෙස්ත්‍රාත්වරයාගේ අත්සන සහ මුද්‍රාව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක **32**, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.